# සමෘද්ධි බැංකු සංගම්හි ණය කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය

## රටවිරුවෝ නිවාස ණය යෝජනා වැඩසටහන

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහසයවන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,
   සමෘද්ධි බැංකු සංගමය, ……………………………
2. කළමනාකරු,
   සමෘද්ධි බැංකු සංගමය, ……………………………
3. සභාපති, විධායක කමිටුව,
   සමෘද්ධි මහ සංගමය, ……………………………
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   සමෘද්ධි මහ සංගමය, ……………………………………
5. මූලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ……………………………………
6. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
   ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ……………………………………
7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ……………………………………
8. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ……………………………………
9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ……………………………………
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අධ්‍යක්ෂවරු,
    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.

**බැංකු මූල්‍ය කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.03.15**

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.03.15

# රටවිරුවෝ නිවාස ණය වැඩසටහන

**බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහසය වන එකතුව**

**1. හැඳින්වීම.**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒකාබද්ධව “රටවිරුවෝ” නිවාස ණය වැඩසටහන යටතේ විදේශගතවන ස්ථිර නිවසක් නොමැති ශ්‍රමිකයන් සඳහා නිවසක් ඉදිකරදීම වැඩසටහනෙහි මූලික අරමුණ වේ.

1.1 සමෘද්ධි බැංකු සංගම් විසින් සිදුකරනු ලබන ආදායම් උත්පාදන ණය, නිවාස ණය ආදියට අමතරව සුවිශේෂී වැඩසටහනක් ලෙස මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක වේ.

1.2 සමෘද්ධි බැංකු සංගමය මගින් සිදුකරනු ලබන ක්ෂුද්‍රමූල්‍ය ණය ක්‍රමවේදයට අමතරව, සිදුකරණු ලබන එක්තරා ප්‍රජා සත්කාරක ණය වැඩසටහනක් ලෙසද, මෙම ණය වැඩසටහන දියත් කිරීම අරමුණ වේ.

1.3 සමෘද්ධි බැංකු පද්ධතියට දැනට සම්බන්ධ වී සිටින හෝ අළුතින් අඩු ආදායම්ලාභීන් ලෙස බැංකු පද්ධතියට එකතුවීමට අපෙක්ෂිත ප්‍රජාව ණය වැඩසටහනට ඇතුලත් කරගත හැක.

1.4 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු ලබා විදේශගතවන ශ්‍රමිකයන්ගේ නව නිවසක අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු කාර්යාංශය විසින් ලබාගෙන ඇති අතර, එම අයදුම්පත්‍ර ද අදාල බැංකු සංගම් වෙත සමෘද්ධි අධිකාරිය ඔස්සේ ලබා දියහැක.

**2. අරමුණු.**

2.1 “සැමට නිවසක්” තේමාව යටතේ රජය දියත් කරනු ලබන නිවාස වැඩසටහනට සවියක් දීමේ අරමුණින් සමෘද්ධි බැංකු හරහා මෙම වැඩසටහන දිරිය පියස නිවාස ඉදිකිරීම් ක්‍රමය අනුව ක්‍රියාත්මක කිරීම.

2.2 අඩු ආදායම්ලාභින් සහ සමෘද්ධිලාභී ස්ථිර නිවසක් අහිමි පවුල් සඳහා ස්ථිර නිවසක් හිමිකර දීම.

3. ණය ලබාදිය හැකි ක්ෂේත්‍රය

3.1 තම බැංකු බල ප්‍රදේශයේ ජීවත්වන ස්ථිර ඉඩමක් හිමි විදේශගත වන ශ්‍රමිකයන් සඳහා (ස්ත්‍රී/පුරුෂ) නිවසක් ඉදිකරගැනීම සඳහා පමණක් ණය මුදල ලබාදීමට අපේක්ෂා කෙරේ.

3.2 මුල් අදියරේදී නිවසක් අළුතින් ඉදිකිරීම සඳහා පමණක් ණය මුදල ලබාදීමට අපේක්ෂා කෙරේ.

4. ණය මුදල හා පොලී අනුපාතය

4.1 මේ යටතේ නිවස ඉදිකිරීම සඳහා ලබාදිය හැකි උපරිම ණය මුදල රුපයිල් ලක්ෂ 3 කි. (රු.300,000/- කි.)

4.2 වාර්ෂික පොලී අනුපාතය 10% කි.

4.3 ආපසු ගෙවීමේ කාලය වසර 05 කි.

4.4 මාසික ණය පොලිය හීනවන ශේෂයට අනුව පොලිය ගණනය කෙරේ.

4.5 ණය ඉල්ලුම් කරනු ලබන නිවස තැනීමට අපෙක්ෂිත ඉඩම සමෘද්ධි බැංකු බල ප්‍රදේශ තුල විය යුතුය.

5. ණය නිකුත් කිරීමේ ක්‍රමවේදය,

5.1 "රට විරුවෝ" නිවාස ණය ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කිරීමට විදේශගතවන ශ්‍රමිකයාට හෝ කාළත්‍රයාට හිමි ඉඩමක් තිබිය යුතුය.

5.2 අවිවාහක අයෙකු විදේශගත වන්නේ නම් ඔහුට/ඇයට නිවසක් අළුතින් ඉදිකරගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඉඩමේ අයිතිය දෙමාපියන් සතු වීම යටතේ ද ණය ලබාදිය හැක. ඒ සඳහා ඉඩම් හිමි අයගේ කැමත්ත ප්‍රකාශ කර තිබිය යුතුය.

5.3 විවාහක පුද්ගලයින් ණය ඉල්ලුම් කිරීමේ දී සමෘද්ධි බැංකු සංගමයේ ගිණුමක් ආරම්භ කළයුතු අතර, එහි පසු අයිතිය ලෙස කලත්‍රයා සම්බන්ධ කරගත යුතුය.

5.4 කාලත්‍රයා නොමැති අවස්ථාවක වයස 18 ට වැඩි දරුවකු ණය සඳහා සම්බන්ධ කරගත හැකිය.

5.5 වයස 18 කට වැඩි දරුවකු ද නොමැති නම් ඉල්ලුම්කරු විසින් නම් කරනු ලබන ලගම ඥාතියකු හෝ වෙනත් විශ්වාසවන්ත අයකුට ගිණුමේ මුදල් පරිහරණය සඳහා (ඉදිකිරීම සඳහා ලබාදෙනු ලබන ණය මුදල) බලය පැවරිය යුතුය. එසේ බලය

පැවරීමේ දී ලබාගත යුතු පැවරුම් ලිපි ආකෘතිය ඇමුණුම 03 පරිදි වේ. එසේම උකස් ඔප්පුවේ ඇටෝර්නි බලතල ද එම අය වෙත ම ලබාදිය යුතුය.

5.6 ඉල්ලුම්කරු සමෘද්ධි බැංකු සංගමයේ සමාජිකයකු වන්නේ නම් දැනට ලබාගෙන ඇති ණය තිබේනම්, එම ණය ශේෂ පැවතිය ද මෙම නිවාස ණය ලබාගැනීමට ද ඉඩ ප්‍රස්ථාව ඇත.

6. ණය ඉල්ලුම් කරනු ලබන විදේශගත වන ශ්‍රමිකයන් සපුරාලිය යුතු සුදුසුකම්.

6.1 දැනට බැංකු සංගමයේ සමාජිකත්වය දරණු ලබන සමෘද්ධිලාභී/ අඩුආදායම්ලාභී පවුල් ද මෙම ණය සඳහා සුදුසුකම් ලබයි.

6.2 අළුතින් ණය ඉල්ලුම් කිරීම සඳහා අඩු ආදායම්ලාභීන් බැංකු සංගමයට බඳවා ගත යුතු අතර, අනතුරුව ණය ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.

6.3 ණය ඉල්ලුම් කරනු ලබන පුද්ගලයින් කොටස් ගිණුමක් විවෘත කළයුතු අතර, එහිදී අවම වශයෙන් කොටස් 02 ක් සම්පූර්ණ කළයුතු අතර, දැනටමත් සාමාජිකත්වය ලබාගෙන සිටින පුද්ගලයන්ද, කොටස් 02 ක් මිලදී ගෙන තිබීම අනිවාර්ය වේ.

6.4 බැංකු සාමාජිකත්වය ලබාගැනීමෙන් අනතුරුව මාස 03 ඉක්ම වූ පසු ණය ඉල්ලුම් කිරීම මෙහිදී බල නොපැවත්වේ.

6.5 මෙම පුද්ගලයින් සාමාන්‍ය බැංකු ක්‍රමවේදය පරිදි කණ්ඩායම් ගත කිරීම අවශ්‍ය නොවේ.

6.6 සාමාන්‍ය ක්‍රමවේදය අනුව, පියවරයෙන් පියවර ණය මුදල් ලබාගෙන නිසි පරිදි ගෙවා තිබීම යන කොන්දේසිය බල නොපැවත්වන අතර, පළමු ණය මුදල ලෙස රු.300,000/- ක මුදලක් ලබාදීමට ඉඩකඩ ඇත.

6.7 ණය ඉල්ලුම් කරනු ලබන විදේශගතවීමට පෙර අදාල බැංකු සංගමයට පැමිණ මූලික ගිණුම් විවෘත කර අයදුම්පත්, ගිවිසුම් අත්සන් කළයුතුය.

6.8 එමෙන්මවාණිජ්‍ය බැංකුවක අදාල අයදුම්කරු විසින් අනේවාසික විදේශ මුදල් (NRFC) ගිණුමක් විවෘත කළ යුතුය.

එම ගිණුම හරහා ණය වාරිකය හා පොලිය සමෘද්ධි බැංකුව වෙත ලබාගැනීමට අදාල වාණිජ බැංකුවක තහුවරුවක් ලබාගැනීමට කළමනාකරු කටයුතු කළ යුතුය. අදාල සහතිකය ණය ඉල්ලුම් පත්‍රය සමග ඉදිරපත් කිරීම අනිවාර්ය වේ.

6.9 අනේවාසික විදේශ මුදල් තැනපතු (NRFC) ගිණුමේ අංකය, බැංකුව ආදී තොරතුරු අදාල ණය ඉල්ලුම්කරු වෙතින් ලබාගත යුතුය.

7. ණය ලබාදීමේ දී ලබාගත යුතු සුරැකුම් හා ලියවිලි

7.1 ණය ඉල්ලුම්පත්‍රය (ඇමුණුම 01)

7.2 ණය ගිවිසුම් පත (ඇමුණුම 02)

7.3 ඉඩම් ඔප්පුවේ පිටපත

7.4 නොපවරාගැනීම් හා විථි රේඛා සහතිකය (අදාල පාලත් පාලන ආයතනයෙන් ලබාගත්)

7.5 හිමිකම් වාර්තාව (අදාල ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශය අයත් අධිකරණ බල ප්‍රදේශයේ අවුරුදු 10 ට වඩා කටයුතු කරන ලද නීතිඥවරයකු විසින් සඳහන් කරන)

7.6 පත්ඉරු (වසර 20 ක පිටුපසට ලබාගන්න)

8. සමෘද්ධි බැංකු සංගමයට ඉඩම් "උකස" පවරා ගැනීම.

8.1 ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල හෝ දිස්ත්‍රික්කය තුල සිටින සමෘද්ධි අධිකාරියේ නීතිඥ සංචිතයේ සිටින නීතිඥවරකුගේ හෝ වෙනත් නීතීඥවරයකුගේ සේවය මේ සඳහා යොදා ගත හැකිය.

8.2 නිවස ඉදිකිරීම සඳහා වන යෝජිත සැලසුම් 03 ක් මේ සමඟ ලබාදෙනු ලබන අතර, මෙම සැලසුම් පරිදි නිවසක් තෝරා ගැනීමේ අයිතිය ණය ඉල්ලුමකරු සතුවේ. නාගරික හෝ ප්‍රාදේශීය සභා සීමා තුල පවතින ඉඩම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ දී අදාල අනුමැතිය ප්‍රාදේශීය සභාව වෙතින් ලබාගත යුතු වන බැවින් සැලසුම විධිමත් ලෙස අනුමැතිය ලබාගන්නා ලෙස ණයකරු දැනුවත් කළයුතුය.

8.3 ණය නිකුත් කිරීම සඳහා එය අත්‍යාවශ්‍ය කොන්දේසියක් නොවන අතර, අනුමැතිය අවශ්‍ය බල ප්‍රදේශ සඳහා පමණක් එලෙස කටයුතු කළයුතුය.

8.4 ණය ඉල්ලුම් කරනු ලබන පුද්ගලයන් රු.50,000/- ක මූලික තැන්පතුවක් ගිණුමේ තැන්පත් කළයුතු අතර, එය ඉල්ලුම්කරු විසින් හෝ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාල ඉල්ලුම්කරුගේ ගිණුමට බැර කළ යුතුය. එම තැන්පතු මුදල ද ණය මුදල නිකුත් කර අවසානයේ දී නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා නිදහස් කළ හැකිය.

8.4 එනම් ඉඩම උකසට ලබාගැනීමෙන් අනතුරුව ණය මුදලෙහි මුල් අදියර නිදහස් කළ හැකිය.

8.5 ලබාගන්නා උකස් ඔප්පු බැංකු සංගමයේ ආරක්ෂිත සේප්පුවේ සුරක්ෂිතව තැබීමට කටයුතු කළ යුතුය.

9. ණය නිකුත් කිරීම හා අයකර ගැනීම, පසු විපරම.

9.1 ණය අය කර ගැනීම සඳහා වන ක්‍රමවේදය ඇතුළත් ලේඛනය ඇමුණුම 05 පරිදි වේ.

9.2 ලක්ෂ 3 ක් වන ණය මුදල අධියර තුනකින් නිදහස් කළ හැකි අතර, ඒ සඳහා කාලසීමාවක් බල නොපැවත්වේ.

9.3 නිවසේ ඉදිකිරීම් ප්‍රවනතාවය සළකා බලා අධීක්ෂණය කිරීමෙන් අනතුරුව ඊළග අදියරයෙන් පියවරයෙන් පියවර නිදහස් කළ හැකිය.

9.4 අනුමත කරන ලද ණය මුදල අදාල ඉල්ලුම්කරුගේ සාමාජික තැන්පත් ගිණුමට මාරු කර, ඉන් අනතුරුව පියවරයෙන් පියවර ණය මුදල කොටස් නිදහස් කළ යුතුය.

9.5 ණය මුදලේ මුල් වාරිකය නිදහස් කළ දිනය ආපසු වාරික අය විය යුතු දිනය ලෙස සලකන බැවින්, අදාල විදේශගත වූ ඉල්ලුම්කරුගේ (NRFC) ගිණුමට මුදල් ලැබී නොතිබුණ ද, ණය වාරිකය හා පොලිය ඇටෝර්නි බල තල පැවරූ අය දැනුවත් කර අය කරගැනීමට කටයුතු කළ යුතුය.

9.6 ණය ඉල්ලුම් කිරීමේ සිට නිවස ඉදිකිරීම දක්වා පසු විපරම හා අධීක්ෂණ කටයුතු සඳහා වසමේ සංවර්ධන නිලධාරි හා සමාජ සංවර්ධන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

10. රටවිරුවෝ නිවාස ණය ඉල්ලුම්කරුවන් රක්ෂණය කිරීම.

10.1 "රට විරුවෝ" නිවාස ණය වැඩසටහන යටතේ ණය ලබාගන්නා සියළු ණයකරුවන් දේපල රක්ෂණය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඔස්සේ සිදුකිරීමට සමෘද්ධි අධිකාරිය කටයුතු කරනු ලැබේ.

10.2 ඒ සඳහා වැය වන රක්ෂණ ගාස්තුව ප්‍රධාන කාර්යාලය මගින් රක්ෂණ සංස්ථාව වෙත ගෙවනු ඇත.

10.3 අදාල රක්ෂණය ණයකරුවන් වෙත ලබාදීම සඳහා බැංකු සංගමය පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

(a) සෑම මාසයක්ම අවසානයේ දීම මුල් ණය වාරිකය නිකුත් කළ විගස ණයකරුවන්ගේ විස්තර ඇමුණුම 04 පරිදි සම්පූර්ණ කර සමෘද්ධි අධිකාරියේ බැංකු මූලා කටයුතු අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

(b) ණය මුදලේ ආරක්ෂාව වෙනුවෙන් මෙම රක්ෂණය සිදුකරනු ලබන බැවින්, ප්‍රධාන කාර්යාලයෙන් විමසා හෝ අදාල රක්ෂණය නියමිත වේලාවට සිදුකරගැනීම කළමනාකරු විසින් පසුවිපරම් කළයුතුය.

11. ගිණුම් සටහන් තැබීම හා වාර්තා තබා ගැනීම.

පහත සඳහන් ගිණුම් පොදු ලෙජරයේ විවෘත කළ යුතුය.

11.1 දුන් ණය රටවිරුවෝ නිවාස ණය - කේත අංක
අදාල පොලිය බැංකු සංගමයේ ලද පොලී දුන් ණය ගිණුමටම ලබාගැනීමට කටයුතු කළ යුතුය.

11.2 අවශ්‍යා අවස්ථා වලදී විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත තොරතුරු ලබාගැනීමේ පහසුව සඳහා "රටවිරුවෝ" නිවාස ණය වැඩසටහන යටතේ ලබාදුන් නිවාස ණය වෙනුවෙන් වෙනම ලෙජරයක් බැංකු සංගමයේ පවත්වාගෙන යා යුතුය.

12. පොදු කරුණු,

12.1 මුලතිව්, කිලිනොච්චි,මන්නාරම සහ යුද්ධයෙන් විනාශ වූ දිස්ත්‍රික්කයන් හී ඇති බැංකු සංගම් සඳහා ණය ලබාදීමට ප්‍රතිපාදන නොමැති නම් ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍යා කටයුතු අංශයෙන් ප්‍රතිමූල්‍යා ණය ලබාගැනීමෙන් මෙම ණය ලබාදිය හැක.

12.2 ප්‍රතිමූල්‍යා ණය ලබාගැනීම සඳහා වන මෙහෙයුම් උපදෙස් අංක 9 සහ ඊට කරන ලද එකතුන් හී දක්වා ඇති අතර, ඒ පරිදි අදාල ප්‍රතිමූල්‍යා ණය ,ණයකරුවන් සඳහා ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙමු.

12.3 මෙම චක්‍රලේඛණය සහ අදාල ඇමුණුම් සමෘද්ධි අධිකාරියේ වෙබ් අඩවිය වෙත පිවිසීම තුලින් ලබාගත හැකි බව වැඩිදුරටත් දන්වමු.

ආර්.පී.බී. තිලකසිරි,

අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,

නි. අධ්‍යක්ෂ -බැංකු මූල්‍යා කටයුතු හා මහ සංගම්.